**සමාගම් අරමුදල - 2016**

**---------------------------------**

සමාගම් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, අරමුදලේ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 (6) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පවිත්‍රතා, වසංගත රෝග හා ආරක්ෂක වියදම් වලට අදාළ උපචිත වියදම් රු.336,555 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාළ උපචිත වරිපනම් බදු රු.326,797 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම් රු.458,352 ක් වැඩිපුර ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වැයකර තිබූ රු.13,268,449 ක් කෙරී ගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට ප්‍රාග්ධනිත කර සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,342,762 ක් ක්ෂය කර තිබුණි. එම පරිගණක පද්ධතිය නිමකිරීමකින් තොරව අතහැර දමා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වාහන වලට අදාළ ක්ෂය රු.601,754 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) මාසික ආදායම් වාර්තා අනුව, සමාගම් අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු මුළු ආදායම රු.329,012,495 ක් වූ නමුත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.327,172,242 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.1,840,253 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට අරමුදලට ලැබිය යුතු හිඟ ආදායම රු. 575,969,333 ක් ගිණුම් ගත කර නොතිබුණ අතර රු. 495,416,667 ක් ලෙස සටහනකින් පමණක් දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2007 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අයවීම් හිඟහිට තිබූ වාර්ෂික වාර්තා ආදායම රු.572,433,332 ක් වූ අතර ඉන් වසර 3 ට වැඩි ශේෂ එකතුව රු.147,306,666 ක්ද වසර 1 ත් හා 3 ත් අතර එකතුව රු. 274,306,666 ක්ද වසරකට අඩු ශේෂ එකතුව රු.150,820,000 ක් ද විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128(2)(ඉ) | රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතුකර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවද, ආයතනය විසින් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 ඡේදය | |
| (i) (අ) වගන්තිය | අයවීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේනම් එම ප්‍රමාණයද පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා නොතිබුණි. |
| (ii) (ආ) වගන්තිය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතු වීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.408,130,934 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.400,693,933 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.7,437,001 කින් වර්ධනය වී තිබුණි. භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර පොළිය රු.33,775,207 කින් වැඩිවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තයක් ලබා තිබූ අතර එහි අඛණ්ඩ වර්ධනයක් ඇතිවී තිබුණි. තවද, මූල්‍ය ප්‍රතිඵලයට, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු. 290,829,596 ක් වූ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු. 422,320,125 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

**3.2** **ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව අධිකරණවල නඩු 101 ක් සහ බාහිර පාර්ශව විසින් දෙපාර්තමේන්තුවට එරෙහිව අධිකරණවල නඩු 171 ක්ද ගොනු කර තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මෙහෙවර වන්නේ රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දැරීම වේ. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත, සමිති ආඥා පනත (123 වන අධිකාරිය), 1935 අංක 61 දරන සීට්ටු ආඥා පනත සහ 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යන ආඥා පනත් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය සඳහා සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම් සහ මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම් ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| **කාර්යය** | **වර්ෂය** | | **සමාලෝචිත වර්ෂයේ වැඩිවීම/(අඩුවීම)** | **වැඩිවීම/(අඩුවීම) ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **2016** | **2015** | | |
| **සමාගම් වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම** | | | | |
| වාර්ෂික වාර්තා ඉදිරිපත් කරන ලද සමාගම් සංඛ්‍යාව | 37,250 | 41,199 | (3,949) | 10 |
| වාර්ෂික වාර්තාවලින් ලද ආදායම (රු.) | 186,083,500 | 206,005,000 | (19,921,500) | 10 |
| **මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම** | | | | |
| සමාගම් සංඛ්‍යාව | 2,162 | 2,509 | (347) | 14 |
| ආදායම (රු.) | 2,162,000 | 2,509,000 | (347,000) | 14 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 (1) සහ (2) වගන්ති ප්‍රකාරව, සෑම සමාගමක් විසින්ම ගෙවිය යුතු වාර්ෂික වාර්තා ආදායම්වලින් 2016 දෙසැම්බර් 31 දිනට විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සංශෝධිත හිඟ ආදායම් වාර්තා වලට අනුව, අයවිය යුතු මුළු හිඟ ආදායම රු.858,650,000 ක් විය. මෙම හිඟ ආදායමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට, අරමුදලට අදාළ හිඟ ආදායම රු.572,433,333ක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එම ආදායම රු.153,606,667 කින් හෙවත් සියයට 37 කින් වැඩිවී තිබුණි.

(ආ) සමාගම් පනතේ 170 (1) වගන්තියට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් සංඛ්‍යාව 7,466 ක් වුවද ලියාපදිංචි කළ සංඛ්‍යාව 2,162 ක් වූ අතර ලබාගෙන තිබූ මුළු ආදායමවූ රු.2,162,000 කින් අරමුදලට අදාළව රු.1,441,333 ක් බැරකර තිබුණි. පනත ප්‍රකාරව මූල්‍ය වාර්තා ලියාපදිංචි කළ යුතු සමාගම් හඳුනාගෙන එම වාර්තා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරවීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතු නොවිය.

## 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ රු. 88,812,207 ක කොන්ත්‍රාත්තුවක් 2014 ජනවාරි 24 වන දින කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් රු.13,619,577 ක මුදලක් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලබන සියලුම වියදම් අරමුදලින් දැරිය හැකි වුවත්, පනතේ 4 වන උප වගන්තිය යටතේ අනුමත වියදම් යටතට නොගැනෙන, සීමිත සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි 2007 වර්ෂයේදී අරමුදලින් රු.90,275,000 ක් වැය කර තිබුණි. 2017 සැප්තැම්බර් 30 දක්වාම මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණු අතර එම සමාගම බුන්වත්වීම නිසා එය 2007 වර්ෂයේදී ඈවර කිරීමට තීරණය කර තිබුණි. තවද, ඉහත ආයෝජිත මුදලට අදාළ අයිතිවාසිකම් හෝ ආයෝජිත මුදල් නැවත සමාගම් අරමුදලට ලබාගැනීමට ගන්නා ලද විධිමත් ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

------------------

2016 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එමගින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සිදු කරනු ලබන එක් එක් කාර්යයන්ගේ ස්වභාවය සහ ඒවා සඳහා වගකිව යුතු නිලධාරීන්, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගත වන කාලසීමාවන් පැහැදිලිව දක්වා නොතිබුණි. ඒ හේතුවෙන් අරමුදලේ කාර්යසාධනය ඇගැයීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසදීමේ දී සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ගිණුම් සටහන් ඉදිරිපත් කර නොතිබීම. |
| (ආ) | පොත්පත් හා ලේඛන පවත්වා ගෙන යාම | වර්ෂය තුළ එකතු කිරීම්, ක්ෂය කිරීම් හා ශුද්ධ අගය පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම. |
| (ඇ) | ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | අරමුදල යටතේ ලියාපදිංචි කරන ලද, ඇවර කරන ලද හා නාමය කපා හරින ලද සමාගම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට විධිමත් වූ පරිගණක පද්ධතියක් ස්ථාපිත කර නොතිබීම. |